# 24

# නබි (සල්) තුමාගේ උතුම් වූ අනුගාමිකයන්

නබි (සල්) තුමාණන්ව තම ජීවිත කාලයේ සෘජුව දුටු මුස්ලිම්වරුන් සහාබාවරුන් ලෙස හැඳින්වේ. මොවුහු නබි (සල්) තුමාණන් හා සමීපව කටයුතු කරමින් ඉස්ලාමයේ වර්ධනයට තම ප්‍රාණය, සිරුර, ධනය, ශක්තිය, කාලය, දැනුම, සැප යනාදී සියල්ල කැප කළ පුද්ගලයෝ ය. ඔවුන් සියලු දෙනාම අල්ලාහ්ගේ මනාපයට පාත්‍ර වුයේ මේ නිසා ය. මේ පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයේ ද සඳහන් කරයි.

''අල්ලාහ් ඔවුන්ව මනාප කරගත්හ. ඔවුන් ද අල්ලාහ්ව මනාප කර ගත්තේ ය''(98:8)

එබැවින් සහාබාවරුන්ගේ නම් උච්චාරණය කරද්දී ''රලියල්ලා අන්හු'' යනුවෙන් අපි පවසන්නෙමු. මෙහි අර්ථය අල්ලාහ් ඔවුන් සියලු දෙනා මනාප කරගත් බවයි.

නබි (සල්) තුමාණන් ද ''යුගයන්ගෙන් ශ්‍රේෂ්ඨ වන්නේ මමත් සහාභාවරුත් ජීවත් වූ යුගයයි'' යනුවෙන් ප්‍රශංසා කොට ඇත. මෙම හදීසය සහාබාවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වයට වැදගත් සාක්ෂියකි.

සමහර සහාබාවරුන් පිළිබඳ ව කෙටියෙන් දැනගනිමු.

## සෙයිද් බින් සාබිත් (රළි)

බද්ර් සටන සඳහා මදීනාවේ ආරාධනා නිකුත් විය. කඩුවක් ඉනේ රඳවාගත් කුඩා ළමයෙක් පැමිණෙන්නට විය. කඩුව බිම ගෑවෙමින් තිබිණි. කුඩා දරුවන් සටනට යෙදවීම අනුමත නොකරන බවට දැන්වීම නිකුත් විය. මේ නිසා බලාපොරොත්තු සුන් වූ එම කුඩා දරුවා තම මව වෙත හැරුණි. තම දරුවාගේ කනගාටුව වටහාගත් මව, අල්කුර්ආනයේ සූරාවන් (පාඩම්) මනනය කොට නබිතුමාට ඉදිරිපත් කරන ලෙස පැවසුවා ය.

සටන නිමා වී පැමිණි නබි (සල්) තුමාට එම කුඩා දරුවා මනනය කළ කරුණු පිළිගන්වන ලදි. එවිට නබි (සල්) තුමා අත් අඩංගුවේ පසුවූ රැඳවියෙකු වෙත මෙම කුඩා දරුවා යවා ලිවීම හා කියවීම ඉගෙනීමට යොමු කළේය. කෙටි කලකින් ඉගෙනීම හමාර කළ එම කුඩා දරුවා පසුකාලයේ නබිතුමාගේ ඉල්ලීමට අනුකූලව අබරානි හා සූර්යානි භාෂාවන් ද ඉගෙන ගත්තේ ය.

පසුකාලීන ඉස්ලාමයේ වර්ධනයට ඉමහත් කාර්යභාරයක් ඉටු කළ එම කුඩා දරුවා වන්නේ සයිද් බින් සාබිත් (රළි) වේ. නබි (සල්) තුමා හා සමීපව ජීවත් වූ වැදගත් සහාබාවරුන්ගෙන් කෙනෙකු ලෙස සයිද් බින් සාබිත් (රළි) කටයුතු කළේ ය. අරාබිකරයේ එදා විසූ ලිවීමට හා කියවීමට දත් අය අතර මොහු ද කෙනෙකි. අල්කුර්ආනය ඉතා හොඳින් පාරායනය කිරීමට දත් මොහු ඉතා ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙකු ද වන්නේ ය.

අල්කුර්ආනය ආරක්‍ෂා කිරීම, එය මනනය කිරීම, පිටපත් කර සුරැකීම යනාදිය උදෙසා ඉමහත් දයකත්වයක් දැක්විය. රමලාන් මාසයේ ජිබ්රිල් (අලෛ) විසින් කුර්ආනය නබි (සල්) තුමාට පාරායනය කොට දක්වද්දී එතුමාණන් සමඟ සිට එයට සවන් දුන්නේ ය. අබුබක්කර් (රළි) තුමාගේ කාලයේ අල් කුර්ආනය එක්රැස් කිරීමට උරදුන් මොහු, උස්මාන් (රළි) කාලයේ අල් කුර්ආනය පිටපත් කිරීමට ද දායක විය.

## සල්මාන් ෆාරිස් (රළි)

සල්මාන් ෆාරිස් (රළි) තුමා සහාභාවරුන් අතර ඉතා වැදගත් කෙනෙකි. නමින් සල්මාන් වූ ඔහු පැරිස් දේශයට අයත් කෙනෙකි. මෙනිසා සල්මානුල් ෆාරිස් යනුවෙන් අමතන ලදි. මොහු ගින්නට වඳින ''මජූසි'' පවුලක ඉපදුනේය.

ගින්නට වඳින දහම සත්‍යයෙන් තොර බව සල්මාන්ට හැඟී ගියේ කුඩා කල සිටම ය. සත්‍ය දහම සොයාගැනීමෙ අපේක්‍ෂාව ඇතිවූයේ මේ නිසා ය. කිතු දහම පිළිබඳ දැනගැනීම උදෙසා මුලින් ම සිරියාවට ගියේ ය. අරාබි දේශයෙහි නබි කෙනෙකු එවනු ලබන ප්‍රවෘත්තිය හා ඔහුගේ ගුණාංගයන් පිළිබඳ ව එහි සිටි ක්‍රිස්තියානි දේශකයෙකු මගින් දැනගත්තේ ය. එතුමාව හමුවීමේ අපේක්‍ෂාව ඔහු තුළ ලියලන්නට වූයේ මෙනිසා ය.

වෙළෙඳ කණ්ඩායමක් සමඟ සිරියාවේ සිට අරාබි දේශයට ගමන් කළේ ඉන් අනතුරුව ය. එලෙස ගමන් කරද්දී වෙළෙඳ කණ්ඩායම විසින් යුදෙව්වෙකුට ඔහු විකුණා දැමුවේ වහලෙකු ලෙස ය. දින කීපයකට පසුව එම යුදෙව්වාගේ සුළු පියාගේ පුතා විසින් ඔහුව මිල දී ගෙන මදීනාවට රැගෙන ගියේ ය. මදීනාවේ රසූල් (සල්) තුමා සිටින බව දැන එතුමා බැහැදැකීමට ඇලුම් කළේ ය.

නබිතුමාණන් හමුවූවිට, එතුමා ළඟ තිබූ නුබුවතයේ (නබිත්ත්වයේ) සලකුණු දැන ගත්තේය. අල්ලාහ්ගේ අවසාන දූතයා මොහු බව නියත වශයෙන් ම වටහා ගත්තේ ය. නබි (සල්) තුමාගේ දැන තදින් අල්ලා ඉස්ලාමය වැළඳ ගත්තේ ඉන් අනතුරුව ය. නබි (සල්) තුමාණෝ එම යුදෙව්වාට නියමිත මුදල ගෙවා වහල් භාවයෙන් ඔහුව මුදවා ගත්හ.

මෙතුමා චාම් ජීවිතයක් ගත කළේ ය. දුගී බව අගය කළේ ය. තමාට යයි පැල්පත ක්වත් තබා නොගත්තේ ය. තම දෑතින් ම උපයා අනුභව කළේ ය. ඉන් කොටස ක් දන් දෙයි. පසු කාලිනව ''මදායින්'' ප්‍රදේශයේ ''අමීර්'' නායකයා ලෙස පත් කළ ද තම චාම් බව අත්හැරියේ නැත. ඉස්ලාමය වෙනුවෙන් මෙතුමා විවිධ සේවාවන් ඉටු කළේ ය. අගල් සටනේ දී අගල් හෑරීමට යෝජනා කළේ මොහු ය. මොහු නබි (සල්) තුමාගේ විවිධ හදීසයන් ඉගෙන ඒවා දැනුම් දී ඇත. මෙලෙස ඉස්ලාමය වෙනුවෙන් ශ්‍රේෂ්ඨ කර්තව්‍යයක් ඉටුකළ සල්මානුල් ෆාරිස් (රළි) තුමා හිජ්රි 35 වසරේ මදායින් හි වෆාත් විය.

**අභ්‍යාස**

1. සහාබාවරු යනු කවුරුන්ද?
2. ශ්‍රේෂ්ඨ කාලය යනුවෙන් නබි (සල්) තුමා සඳහන් කළ කාල වකවානුව කුමක්ද?
3. සෙයිද් බින් සාබිත් (රළි) හැදෑරූ භාෂා දෙක කවරේද?
4. සයිද් බින් සාබිත් (රළි) ඉටුකළ කාර්යයක් 2ක් සඳහන් කරන්න.
5. සල්මානුල් ෆාරිස් (රළි) තුමා කුමන දේශයට අයත් කෙනෙක් ද?
6. සල්මානුල් ෆාරිස් (රළි) තුමාගේ ගුණාංගයන් දෙකක් දක්වන්න.